අභ්‍යන්තර චක්‍රලේඛ :- 02/2022

මගේ අංකය :- BD/PGH/CPMA/01/2013
පළාත් මහ රෝහල
බදුල්ල.
2022-06- 16

කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරින් වෙත,

## රාජ්‍ය නිලධාරින් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයේ (අග්‍රහාර) දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම


ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ඔබ දැනටමත් ලියාපදිංචි වී ඇති නමුත්, එහි දත්ත පද්ධතියේ ඇති ඔබගේ තොරතුරු යාවත්කාලීන නොවීම නිසා රක්ෂණ හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීමේදී ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුව ඇති බැවින්, ඒ සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් (Agrahara web portal) රක්ෂණ භාර අරමුදල විසින් හඳුන්වා දී ඇත. එම දත්ත පද්ධතියට ඔබටද අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයකින් හෝ ජංගම දුරකතනයකින් ප්‍රවේශ වී එම දත්ත පද්ධතියේ තොරතුරු යාවත්කාලීන කිරිමට අවශ්‍ය පහසුකම් සළසා දී ඇත. ඒ අනුව පහත දැක්වෙන ක්‍රමවේදය ඔස්සේ අදාළ දත්ත පද්ධතියට පිවිස ඔබගේ තොරතුරු පරික්ෂා කර බලා ඒවාහි වැරදි ඇතොත් නිවැරදි කර, සමහර දත්ත නොමැතිනම්, අලුතින් දත්ත ඇතුළත් කිරීමත් සිදු කර, යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. ඔබ විසින් ඇතුළත් කරනු ලබන දත්ත පෞද්ගලික ලිපිගොනුවේ තොරතුරු සමඟ සසඳා බලා ඒවා අනුමත කිරිමටද ක්‍රමවේදයක් සළසා ඇති බැවින්, නිවැරදි හා සත්‍ය දත්ත පමණක් ඇතුළත් කිරිමට කටයුතු කරන ලෙසද දන්වමි. මෙම දත්ත පද්ධතියට ප්‍රවේශවීමේ අවසන් දිනය 2022-07-31 වන අතර, යාවත්කාලීන කළ දත්ත පරික්ෂා කර අනුමැතියද ලබා දිය යුතු බැවින්, ඔබ විසින්, 2022-07-10 දිනට පෙර පහත දැක්වෙන ක්‍රමවේදය ඔස්සේ දත්ත ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

02. තවද, යම්කිසි නිලධරයෙකුට දත්ත පද්ධතියට ප්‍රවේශවීමට පහසුකම් නොමැතිනම් පමණක් තොරතුරු තාක්ෂණ අංශයේ තොරතුරු තාක්ෂණ නිලධාරි සංජීව ජයසේකර මහතා වෙත ගොස් දිනයක් හෝ වේලාවක් වෙන් කර ගෙන මේ සමඟ අමුණා ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරුද සමඟ පැමිණ දත්ත ඇතුළත් කිරීමටද පහසුකම් සළසා ඇත.

**03. දත්ත පද්ධතියට ප්‍රවේශවීමේ ක්‍රමවේදය :-**

දත්ත පද්ධතියට ප්‍රවේශවීම සඳහා google chrome වෙබ් බවුසරය මඟින් www.nitf.lk වෙබ් අඩවියට පිවිසිය යුතුය.


එහිදී පහත කවුළුව (Window) දැකිය හැකිය.






අග්‍රහාර රක්ෂණ භාර අරමුදලේ (National Insurance trust Fund)වෙබ් අඩවියේ (www.nitf.lk ) මුල් පිටුවේ (Home) පහළින්ම සඳහන් Member login යන ස්ථානය තෝරාගෙන විවෘත කරන්න.

ඉන්පසු පහත සඳහන් කවුළුව (Window) දැකිය හැකිය. මේවනවිටත් එහි ලියාපදිංචි වී නොමැති නිසා අළුතින් ලියාපදිංචි විය යුතුය.

මෙහි signup now යන්න තෝරා ඉන්පසුව ලැබෙන කවුළුවෙහි ඇති තොරතුරු සම්පූර්ණ කර යොමු (submit) කළ යුතුය.





ඉන්පසුව මෙවැනි කවුළුවක් විවෘත වන අතර, ඔබ යොදනු ලැබූ ඊමේල් ලිපිනයට කේතාංකයක් (verification code) ලැබෙනු ඇත. ඔබගේ ඊමේල් විවෘත කර එම කේතාංකය නියමිත ස්ථානයට යොදා දත්ත පද්ධතියට ඇතුළු විය හැකිය.


දත්ත පද්ධතිය සහිත කවුළුව පරිගණක තිරයේ පහත පරිදි දිස්වේ.




දත්ත පද්ධතියේ කවුළුවේ ඇති දත්ත යාවත්කාලීන කිරීමට නම්, Edit Profile යන ස්ථානය click කර එය විවෘත කළ පසු ඔබගේ දත්ත යාවත්කාලීන කිරීමේ පහසුකම ලැබෙනු ඇත. ඔබගේ හා කලත්‍රයාගේ හා දරුවන්ගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කළ යුතුය. අවිවාහකනම්, මවගේ හා පියාගේ තොරතුරු ඇතුළත් කළ යුතුය.

මෙම ස්ථානයේ ඇති ඊමේල් ලිපිනය ඔබගේ ඊමේල් ලිපිනයදැයි පරික්ෂා කර බලන්න. දත්ත සියල්ල යොමු කර submit කිරීමෙන් පසු මෙම ස්ථානය click කර (logout) පිටව යාමට හැකිය.

තොරතුරු සියල්ල සම්පූර්ණ කළ පසු නැවත පරික්ෂා කරබලා නිවැරදි බව තහවුරු කරගෙන කවුළුවේ පහතින් ඇති **Submit** බටනය **Click** කර දත්ත පද්ධතියට යොමු කළ යුතුය.




දත්ත පද්ධතියට යොමු කළ තොරතුරු නැවත පෞද්ගලික ලිපිගොනුව සමඟ පරික්ෂා කර බලා නිවැරදි බව තහවුරු කරගෙන අනුමැතිය ලබා දීමෙන් පසුව ඔබගේ තොරතුරු දත්ත පද්ධතියට ස්ථිර වශයෙන්ම ඇතුළත් වේ.

04. මෙම දත්ත පද්ධතිය අනුව ඉදිරියේදී රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ලබා දීමට අපේක්ෂිත බැවින්, ඔබගේ තොරතුරු 2022-07-10 දිනට පෙර යාවත්කාලීන කිරීමට පියවර ගන්නා ලෙස මෙයින් නැවත දැනුම් දෙමි.

05. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය වේනම්, ප්‍රධාන කාර්යාලයේ අග්‍රහාර විෂය භාර රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර හෝ තොරතුරු තාක්ෂණ අංශයේ තොරතුරු තාක්ෂණ නිලධාරි හෝ පරිපාලන නිලධාරි අමතන්න.

වෛද්‍ය උපුල් කරුණාරත්න
අධ්‍යක්ෂ
පළාත් මහ රෝහල
බදුල්ල.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

| |
|---|
| තනතුර:- |
| Designation }- |

| |
|---|
| වැටුප් අංකය :- |
| Pay no: |

**(සැ.යු.:- දත්ත ඇතුළත් කිරීමට පහසුකම් නොමැති නිලධාරීන් පමණක් මෙම තොරතුරු සමඟ තොරතුරු තාක්ෂණ අංශයට පැමිණිය යුතුය.)**

## අග්‍රහාර දත්ත පද්ධතියට (Agrahara web portal) ඇතුළත් කිරීමේ දත්ත පත්‍රිකාව

01. ජාතික හැඳුනුම්පත් අංකය :-
National Identity Card No.

02. මුලකුරු සමග නම:
Name with Initials

03. සම්පූර්ණ නම :-
Full name

04. උපන් දිනය :-
Date of birth

M M D D y y y y
මාසය දිනය වර්ෂය

| |
|---|
| **රක්ෂණ ක්‍රමය** |
| **Type of insurance** |
| රන් / රිදී /සාමාන්‍ය |
| Golden / silver/ normal |

05. ඊමේල් ලිපිනය:-
E-mail address

06. දුරකතන අංකය :-
Telephone no:

| |
|---|
| **විවාහක/අවිවාහකබව Civil status** |
| විවාහක /අවිවාහක |
| Married / unmarried |

07. ලිපිනය :-
Address

08. කලත්‍රයාගේ විස්තර (ස්වාමිපුරුෂයා/භාර්යාවගේ) Details of spouse }-

08.1.ජාතික හැඳුනුම්පත් අංකය :-
National Identity Card No. of spouse

08.2 සම්පූර්ණ නම :-
Full name

08.3 උපන් දිනය :-
Date of birth

M M D D y y y y
මාසය දිනය වර්ෂය

09. දරුවන්ගේ විස්තර (Details of children) අවිවාහක නිලධාරියෙක් නම් මෙහි මවගේ හා පියාගේ නම් ලියන්න.

| | සම්පූර්ණ නම<br>Full Name | උපන් දිනය (මාසය/දිනය/වර්ෂය)<br>Date of birth | | | | | | | | ස්ත්‍රී/පුරුෂ භාවය<br>Gender |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | M | M | D | D | y | y | y | y | |
| 1 | | | | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | | | | | | | | |
| 4 | | | | | | | | | | |
| 5 | | | | | | | | | | |